## ජාතික සමූපකාර සංවර්ධන ආයතනය - 2011

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට ජාතික සමූපකාර සංවර්ධන ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත දැක්වෙන අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| ප්‍රමිති 18 | (i) වර්ෂ 05 කට වැඩි කාලපරිච්ඡේදයක් තුළදී පාවිච්චියෙන් ඉවත් කර තිබුණු ස්ථාවර වත්කම් වටිනාකම්, පොත්වලින් කපා හැරීම හෝ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම හෝ කර නොතිබුණි. |
| | (ii) වටිනාකම සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද එහෙත් තවම භාවිතයේ පවතින ගත්මිල වටිනාකම රු. මිලියන 13.38 ක් වූ වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම් ගත කර නොතිබුණි. |
| | (iii වත්කමේ ප්‍රයෝජනවත් ජීව කාලය පදනම් කරගෙන පරිගණක හා පරිගණක උපාංග, යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ, මෝටර් වාහන, පුස්තකාල පොත් යනාදී ස්ථාවර වත්කම් ක්ෂය කර නොතිබුණි. |

1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ගෙවීමට ඉදිරිපත් නොකළ චෙක්පත්, උපලබ්ධි නොවූ චෙක්පත් , මුදල් ඇනවුම් , බැංකු ඍජු බැර , බැංකු ඍජු හර, අගරු චෙක්පත් , මුදල් පොතේ සංශෝධනය කළ යුතු ශේෂ , බැංකු ගාස්තු යනාදී විෂයයන් 08 කට අදාල එකතුව රු.424,781 ක් වූ නිරවුල් නොකල අගයන් වර්ෂ 05 කට වැඩි කාලයක සිට දිගින් දිගටම බැංකු ගිණුම් 05 කට අදාල බැංකු සැසඳුම්වල දක්වා තිබුණි. ඒවා සැසඳුම් කර නිරවුල් කිරීමට හා නිවැරදි ලෙස ගිණුම්ගත කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) නේවාසිකාගාර කාමර හා දේශන ශාලා සඳහා 2001 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා කාලය තුල මිලදී ගත් එකතුව රු.106,025 ක් වූ තිර රෙදි, ඇද ඇතිරිලි, මෙට්ට යනාදී පාරිභෝජ්‍ය ද්‍රව්‍ය , ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

1.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ 01 සිට 05 දක්වා කාලයක් හිඟහිට තිබුණු පාඨමාලා ගාස්තු, බාහිර සේවා ගාස්තු, මුද්‍රණ ගාස්තු, ගොඩනැගිලි බදු කුලී හා ජල ගාස්තු එකතුව රු.1,312,326 ක් වූ ලැබිය යුතු ශේෂ 05 ක් අයකර ගෙන නොතිබුණි .

(ආ) 2011 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 05 කට වැඩි කාලයක් තුල සමුච්චිත වී තිබුණු රු. 13,446,550 ක් වූ ලැබිය යුතු එකතු කල අගය මත බදු (VAT) ශේෂ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් අයකර ගෙන නොතිබුණු අතර එම ගිණුම් ශේෂ වර්ෂ 05 කට වැඩි කාලයක් තිස්සේ සැසඳුම් නොකර ගිණුම් වල දක්වා තිබුණි.

(ඇ) වර්ෂ 03 කට වැඩි කාලපරිච්ඡේදයක් තුළ ගිණුම් 04 ක සමුච්චිත වී තිබුණු රු.268,508 ක් වූ ණයහිමි ශේෂ නිරවුල් කිරීමට 2011 දෙසැම්බර් 31 දින වන විටත් පියවර ගෙන නොතිබුණි.

1.2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | |
| (i) xix පරිච්ඡේදයේ 5.3 වගන්තිය | උපලේඛණගත රජයේ නිවාසයක පදිංචි වීම වෙනුවෙන් සේවකයන්ගේ වැටුපෙන් 10 % ක් හෝ ආර්ථික කුලියක් අයකරනු වෙනුවට සුළු නාමික කුලියක් ආයතනය සතු නිල නිවාසවල පදිංචි සේවකයන්ගෙන් අය කර තිබුණි. |
| (ii) vii පරිච්ඡේදයේ 12 වගන්තිය හා 1997 පෙබරවාරි 03 දිනැති අංක 06/97 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | 2011 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 2 කට වැඩි කාලයක් අධ්‍යක්ෂ (අධ්‍යයන හා සංවර්ධන) තනතුරෙහි වැඩ බැලීම වෙනුවෙන් කථිකාචාර්යවරයකුට විධිමත් නොවන පරිදි එකතුව රු.104,575 ක් වූ දීමනා ගෙවා තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| මු .රෙ.756 | වටිනාකම රු.64,056,244 ක් වූ ස්ථාවර වත්කම් සමීක්ෂණය කර සමීක්ෂණ මණ්ඩල වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුල ආයතනයේ වැඩ කටයුතු වල මූල්‍ය ප්‍රතිඵලය රු.9,912,838 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.7,300,759 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලය තවදුරටත් රු.2,612,079 කින් පිරිහී තිබුණි. සේවක වැටුප් හා දීමනා සහ ගිවිසුම්ගත සේවා ගෙවීම් වැඩිවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 2.2 වියදම්වල වැඩිවීම හා අඛණ්ඩ ඌනතාවය

2006 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා ආයතනයේ වියදම් වැඩිවීම හා ඊට සාපේක්ෂව ආදායම අඩුවීමත් නිසා අඛණ්ඩව පැවති ඌනතාවය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | 2011 | 2010 | 2009 | 2008 | 2007 | 2006 | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| ආදායම් වියදම් ගිණුම අනුව ඌනතාවය | (9.91) | (7.30) | (6.17) | (4.14) | (7.61) | (8.88) | (44.01) |
| අඩු කළා : ක්ෂය වීම් | 11.19 | 10.29 | 9.36 | 8.63 | 6.58 | 7.72 | 53.77 |
| ක්ෂය ගැලපීමට පෙර අතිරික්තය/ (ඌනතාවය ) | 1.28 | 2.99 | 3.19 | 4.49 | (1.03) | (1.16) | 9.76 |
| අඩු කළා : පුනරාවර්තන ප්‍රදාන | 22.74 | 22.39 | 21.47 | 19.68 | 13.65 | 8.65 | 108.58 |
| පුනරාවර්තන ප්‍රදාන හා ක්ෂය ගැලපීමට පෙර ඌනතාවය | (21.46) | (19.40) | (18.28) | (15.19) | (14.68) | (9.81) | (98.82) |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2006 සිට 2011 දක්වා වූ වර්ෂ 06 ක කාලය තුල ආයතනය ඉපැයූ ආදායම රු. මිලියන 98.82 කින් ඉක්මවා වියදම වැඩි වී තිබුණි.

(ii) 2006 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා වර්ෂ 06 ක කාලපරිච්ඡේදය තුල රජයේ ප්‍රදාන නොමැතිව ආයතනය රු.මිලියන 98.2 ක සමුච්චිත ඌනතාවයක් ලබා තිබුණද, රජයෙන් ලැබී තිබුණු රු.මිලියන 108.58 ක ප්‍රදාන නිසා එය වැලකී තිබුණි. මේ නිසා ආයතනයේ අඛණ්ඩ පැවැත්මේ අවිනිශ්චිතතාවය විගණනයේදී බැහැර කළ නොහැකි විය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2001 අංක 1 දරන ජාතික සමූපකාර සංවර්ධන ආයතනය (සංස්ථාගත කිරීමේ) පනතේ 4 වගන්තිය පරිදි ආයතනය සංස්ථාගත කිරීමෙන් සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂිත වූ පහත දැක්වෙන ප්‍රධාන කාර්යයන් ඉටු කිරීමට සමාලෝචිත වර්ෂයේදී ද අපොහොසත් වී තිබුණි.

(i) සමූපකාර සංවර්ධනය පිළිබඳ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීමට.

(ii) සමූපකාර සංවර්ධනයට අදාල දත්ත රැස්කිරීම අරහයා සම්පත් මධ්‍යස්ථානයක් වශයෙන් ක්‍රියා කිරීම සහ රැස්කරන ලද දත්ත ප්‍රකාශනය කිරීම මගින් සංචයනය කිරීම හා පතල කිරීමට .

(iii) කළමනාකරණ නිපුණතා අවශ්‍යවන සමූපකාර ව්‍යවසායන් භාරගෙන කළමනාකරණය කිරීමට. හා

(iv) සමූපකාර ව්‍යවසායවලට වෘත්තීය උපදෙස් සැපයීමට.

(ආ) ආයතනය විසින් පවත්වන ලද පාඨමාලාවල ප්‍රගතිය ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත දැක්වේ.

| පාඨමාලාව | 2011 | | | | 2010 | |
|---|---|---|---|---|---|---|
| | ඉලක්කගත | | තථ්‍ය | | තථ්‍ය | |
| | පාඨමාලා සංඛ්‍යාව | පාඨමාලා ලාභීන් සංඛ්‍යාව | පාඨමාලා සංඛ්‍යාව | සහභාගී වූ පාඨමාලා ලාභීන් සංඛ්‍යාව | පාඨමාලා සංඛ්‍යාව | සහභාගී වූ පාඨමාලා ලාභීන් සංඛ්‍යාව |
| නිත්‍ය පුහුණු පාඨමාලා | 02 | 83 | 03 | 110 | 02 | 97 |
| උසස් ඩිප්ලෝමා පාඨමාලා | 14 | 280 | 16 | 297 | 10 | 210 |
| සහතික පත්‍ර පාඨමාලා | 06 | 125 | 05 | 81 | 06 | 135 |
| කෙටිකාලීන කළමණාකරණ සංවර්ධන පාඨමාලා | 27 | 735 | 12 | 351 | 10 | 473 |
| බාහිර ආයතනවල ඉල්ලුම මත පවත්වන ලද පාඨමාලා | - | - | 16 | 682 | 34 | 1,347 |
| සමූපකාර ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා නොමිලයේ පවත්වන ලද පාඨමාලා | - | - | 08 | 380 | 14 | 498 |
| බාහිර උපාධි හා වෘත්තීය ගිණුම්කරණ විභාග සඳහා උපකාරක වැඩ සටහන් | - | - | 04 | 57 | - | - |
| එකතුව | 49 | 1,223 | 64 | 1,958 | 76 | 2,760 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ .

(i) සමාලෝචිත වර්ෂයේ කෙටිකාලීන කළමනාකරණ සංවර්ධන පාඨමාලා පැවැත්වීමේ කාර්ය සාධනය 44 % ක් වූ අතර පාඨමාලා ලාභීන් සහභාගී වී තිබුණේ ඉලක්කගත සංඛ්‍යාවෙන් 48 % ක් පමණකි.

(ii) සමාලෝචිත වර්ෂයේදී සමූපකාර ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා නොමිලයේ පවත්වා තිබුණු පාඨමාලා සංඛ්‍යාව 08 ක් වූ අතර එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව 43 % ක අඩුවීමකි.

(iii) සමාලෝචිත වර්ෂයේ සහතික පත්‍ර පාඨමාලා පැවැත්වීම හා පාඨමාලාලාභීන් සහභාගී කරවීමේ කාර්ය සාධනය පිළිවෙලින් 83 % ක් හා 65 % ක් විය.

(iv) බාහිර ආයතන වල ඉල්ලුම මත පාඨමාලා පැවැත්වීම ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අඩුවීම 53 % ක් විය.

(v) බාහිර උපාධි හා වෘත්තීය ගිණුම්කරණ විභාග සඳහා උපකාරක වැඩසටහන් පැවැත්වීම සමාලෝචිත වර්ෂයේදී ආරම්භ කර තිබුණද, ඉලක්ක තීරණය කර නොතිබුණි. පවත්වා තිබුණු වැඩසටහන් 04 සඳහා සහභාගී වී තිබුණේ පුහුණු ලාභීන් 57 දෙනෙකු පමණකි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුල ආයතනය විසින් පැවැත්වූ පාඨමාලාවලින් ලද ආදායම් ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත දැක්වේ.

| පාඨමාලාව | 2011 | | 2010 |
|---|---|---|---|
| | ඉලක්කගත | තථ්‍ය | තථ්‍ය |
| | රු. | රු. | රු. |
| නිත්‍ය පුහුණු පාඨමාලා | 559,860 | 429,598 | 551,736 |
| උසස් ඩිප්ලෝමා පාඨමාලා | 2,840,688 | 2.051,083 | 2,346,221 |
| සහතික පත්‍ර පාඨමාලා | 1,607,833 | 1,240,529 | 1,314,390 |
| කෙටිකාලීන කළමනාකරණ පාඨමාලා | 2,470.000 | 3,568,596 | 2,651,412 |
| වෘත්තීය ගිණුම්කරණ විභාග සඳහා උපකාරක වැඩසටහන් | - | 197,700 | - |
| බාහිර උපාධි විභාග සඳහා උපකාරක වැඩසටහන් | - | 193,750 | - |
| | 7,478,381 | 7,681,256 | 6,863,759 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) උසස් ඩිප්ලෝමා පාඨමාලා 14 ක් හා ඒ සඳහා පාඨමාලාලාභීන් සංඛ්‍යාව 280 ක් ලෙස අපේක්ෂිත ඉලක්කය ලෙස සඳහන් කර අපේක්ෂිත ආදායම රු.2,840,688 ක් ලෙස දක්වා තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉලක්ක ගත පාඨමාලා සංඛ්‍යාව 02 කින් හා පාඨමාලාලාභීන් ගණන 17 කින් ඉක්මවා තිබුණත්, තථ්‍ය ආදායම ඉලක්කගත ආදායමට වඩා රු.789,605 කින් අඩු වී තිබුණි.

(ii) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී පාඨමාලා මුළු ආදායම රු.817,497 කින් එනම් 12 % කින් වර්ධනය වී තිබුණි.

3.2 අරමුදල් ඌන උපයෝජනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රවනාගාරය ඉදිකිරීම් කටයුතුවල පැවති දීර්ඝ කාල ප්‍රමාදය හේතුවෙන් භාණ්ඩාගාරයෙන් ලැබුණු රු.27,652,257 ක් වූ ප්‍රාග්ධන ප්‍රදාන උපයෝජනය නොකර බැංකු ජංගම ගිණුමේ වර්ෂ 02 ක පමණ කාලයක් නිශ්ක්‍රීයව පැවතුණි.

(ආ) සමූපකාර ක්ෂේත්‍රයේ ජාතික ඵලදායිතා කාර්යසාධන තරඟ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ කාල ප්‍රමාදය හේතුවෙන් රාජ්‍ය බැංකුවකින් ලැබී තිබුණු රු. 1,202,148 ක් වූ ප්‍රදාන උපයෝජනය නොකර බැංකු ජංගම ගිණුමේ වර්ෂ 02 ක කාලයක් නිශ්ක්‍රීයව පැවතුණි.

3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

බහු කාර්ය ගොඩනැගිල්ලේ බිම් මහලේ වාර්ෂික කුලී තක්සේරුව රු.390,000 ක් වුවත්, එය රු.195,000 ක වාර්ෂික කුලියක් මත 2010 අප්‍රේල් 01 දින සිට 2015 මාර්තු 31 දින දක්වා වර්ෂ 05 ක කාලයකට සමූපකාර සමිති සංගමයකට විධිමත් නොවන ලෙස බදු දී තිබුණි. මේ හේතුවෙන් 2011 දෙසැම්බර් 31 දිනට කුලී ආදායම් ලෙස රු. 341,250 ක් ආයතනයට අහිමි වී තිබුණි.

3.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

මුද්‍රණ අංශයට අයත් යන්ත්‍ර 3 ක් පාවිච්චියට නොගෙන වර්ෂ 10 කට වැඩි කාලයක් අභාවිතව පැවතුණි.

3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

(අ) ශ්‍රවණාගාරය ඉදිකිරීම

ශ්‍රවණාගාරය ඉදිකිරීම රු. මිලියන 44.5 ක පිරිවැය ඇස්තමේන්තුවකට පෞද්ගලික ඉදිකිරීම් සමාගමකට 2001 අගෝස්තු මාසයේදී පවරා තිබුණි. ඉදිකිරීම් කටයුතු 2003 අප්‍රේල් මාසය වන විට අවසන් කළ යුතුව තිබුණද, වහලය ඉදි කිරීම් කටයුතු සිදු කෙරෙමින් පැවතියදී 2005 පෙබරවාරි 14 දින කඩා වැටීම නිසා ඉදි කිරීම් අතරමඟ නතර වී තිබුණි. කෙසේවෙතත්, වහලයේ සම්පූර්ණ ඉදිකිරීම්ද ඇතුළත්ව ඉතිරි වැඩ නිම කිරීම රු.මිලියන 113 ක් වූ නව පිරිවැය ඇස්තමේන්තුවකට ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයට 2009 වර්ෂයේදී පවරා තිබුණි. 2012 ජූලි 30 දින වන විටත් , ඉදිකිරීම් නිම කර නොතිබුණි.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වහලය කඩාවැටීම හේතුවෙන් සිදුව තිබූ අලාභය සම්බන්ධයෙන් ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනයෙන් ලබා දී ඇති ආරවුල් නිරාකරණය කිරීමේ වාර්තාව හා අංක සීඅයිටී/4/4/8/2 දරන 2012 මැයි 31 දිනැති රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ලිපිය අනුව, වහලය කඩා වැටීම නිසා ආයතනයට සිදුව ඇති රු.3,907,904 ක් වූ අලාභය, ඉදිකිරීම් සඳහා උපදේශක සේවා සැපයූ උපදේශකවරියගෙන් හා ඉදිකිරීම් සමාගමෙන් (50 % බැගින්) අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියා මාර්ග ගැනීමට නියෝග කර තිබුණද, 2012 සැප්තැම්බර් 30 දින වන විටත් එම අලාභ අයකර ගැනීමට නීතිමය පියවර ගෙන නොතිබුණි.

(ii) උපදේශක සේවා සැපයූ උපදේශකවරිය රාජ්‍ය සේවයේ නියුක්තව සිටියදී, මෙම ඉදිකිරීම් සඳහා අනවසරයෙන් පෞද්ගලික වශයෙන් උපදේශක සේවා සපයා රු.මිලියන 2.15 ක් වූ ගාස්තු ලබා ගැනීම සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කිරීමට අදාල ආයතන දැනුවත් කර නොතිබුණි.

(iii) ශ්‍රවනාගාරයේ ඉදිකිරීම් නැවත ආරම්භ කර ඉදිකෙරෙමින් පැවතියදී, ඉදිකිරීම් සැලසුම් සංශෝධනය නිසා 2012 මැයි මාසයේදී ඉදිකිරීම් කටයුතු නැවතත් නතර වී තිබුණි. 2012 සැප්තැම්බර් 30 දින වන විටත් ඉදිකිරීම් ආරම්භ කර නොතිබුණු අතර නව ඉදිකිරීම් සැලසුම් අනුව රු.මිලියන 97.5 ක් වූ පිරිවැය ඇස්තමේන්තුව ලබාගැනීමට පමණක් කටයුතු කර තිබුණි.

(iv) ඉදිකිරීම් ආරම්භ කල 2001 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා වූ වර්ෂ 11 ක දීර්ඝ කාල ප්‍රමාදය හා ඉදිකිරීම් සැලසුම් සංශෝධනය හේතුවෙන් රු. මිලියන 44.5 ක

පිරිවැයකට නිමකල හැකිව තිබුණු ඉදිකිරීම මුළු පිරිවැය රු.මිලියන 255.0 ක් දක්වා එනම්, රු. මිලියන 210.5 කින් වැඩි වී තිබුණි.

(ආ) සේවා පහසුකම් ප්‍රසම්පාදනය

සමාලෝචිත වර්ෂයේදී ආරක්ෂක, පවිත්‍රතා, භෝජනාගාර යනාදී සේවා සැපයීම් ප්‍රසම්පාදන පිළිබඳව පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2011 වර්ෂය සඳහා ආරක්ෂක, පවිත්‍රතා, භෝජනාගාර යනාදී සේවා සැපයීම් කොන්ත්‍රාත්තු සඳහා ලංසු කැඳවා ලංසුකරුවන් තෝරාගෙන තිබියදී, එය නොසලකා ලංසු ඉදිරිපත් නොකල පුද්ගලික සමාගමකින් අවිධිමත් ලෙස ලබාගත් මිල ගණන් මත ඉහත කොන්ත්‍රාත්තු 03 ප්‍රදානය කිරීම හේතුවෙන් ආයතනයට වර්ෂයකට රු. 1,536,440 ක පාඩුවක් සිදුව තිබීම .

(ii) ඉහත සඳහන් අවිධිමත් තත්ත්වයක් තිබියදී 2012 වර්ෂය සඳහාද ලංසු කැඳවීමෙන් තොරව කොන්ත්‍රාත්තු ගිවිසුම් කාලය දීර්ඝ කර එම පුද්ගලික ආයතනයටම කොන්ත්‍රාත්තු 03 නැවතත් ප්‍රදානය කර තිබුණි.

3.6 කාර්ය මණ්ඩල පරිපාලනය

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 59 ක් වූ අතර තථ්‍ය සංඛ්‍යාව 35 ක් වූයෙන්, පුරප්පාඩු සංඛ්‍යාව 24 ක් විය. මෙම පුරප්පාඩු පිරවීම සඳහා මු .රෙ.71 ප්‍රකාර අනුමැතිය ලබා දී තිබුණද, එම පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි.

4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව සෑම වර්ෂයක් සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණනය සඳහා ඉදිරිපත් කළයුතු වුවද, 2011 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ 2012 ජූලි 26 දිනදීය.

4.2 සංයුක්ත සැලැස්ම

2012 – 2016 වර්ෂ ආවරණය වන පරිදි සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණද, 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ උපදෙස් පරිදි පිළියෙල කර නොතිබුණි.

4.3 අභ්‍යන්තර විගණනය

මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර නොතිබුණි.

4.4 ප්‍රසම්පාදන සැලැස්ම

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශය සංග්‍රහයේ 4.2 මාර්ගෝපදේශය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

5. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින් වර ආයතනයේ සභාපතිවරයා වෙත යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ස්ථාවර වත්කම්

(ආ) හිඟහිටි ආදායම්

(ඇ) කොන්ත්‍රාත්තු පරිපාලනය

(ඈ) මානව සම්පත් කළමනාකරණය.